මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.11.09
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## 2022.12.02 වන දින විශේෂ සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-
ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

නොපැමිණීම:-
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් මස විශේෂ සභා රැස්වීම 2022.12.02 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.-*** නැත

***02.සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන .-*** නැත

***03.සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම -*** නැත

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05.යථා පරිදි කල්දී ඇති යෝජනා***

<u>ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා</u>
ඊට කලින් කියන්න දෙයක් තියනවා මේ සභාව නීති විරෝධියි.මොකද නිරෝෂා පුෂ්පාදරී මන්ත්‍රීතුමියට න්‍යාය පත්‍රය ලැබිලා නෑ.

සභාපතිතුමා
මන්ත්‍රීතුමන්ලා/තුමියන් සියලු දෙනාට_න්‍යාය පත්‍රය යැවීම වගකීමක්.එහෙම ලැබිලා නැත්තම් ඒක අඩුවක්.රියදුරු මහත්මයා වගකීමෙන් කියනවා නිවසට භාර දුන්නා කියලා.වට්ස්ඇප් හරහාද යවලා තියනවා.ඉස්කෝලෙට ගිහින් තියනවා එහෙත් නැති නිසා ගෙදරට දීලා තියනවා.නීත්‍යානුකූලභාවයක් නැත්නම් සභාව ලබන සභා වාරයට කල් තියමු.

මන්ත්‍රීතුමනි,ආදාහනාගාරය ඉදිකිරීම අත්‍යවශ්‍ය දෙයක්.දීර්ඝ කාලයක් තිස්සේ අපි මේ ගැන කතා කරනවා.අපේ අවට සියලු සභාවල් මේ වන විට ආදාහනාගාරය වැඩ අවසන් කරලා තියනවා.සියලු දෙනාම බැලුව ආදාහනාගාරය ඕගස්පෙ ඉඩමෙ ඉදි කරන්න.එක කාලයක මිනිස්සුන්ට මතයක් තිබුණා පොදුජන පෙරමුණ බලයෙ ඉන්නකොට මේක කරන්න බෑ කියලා.යහපාලන ආණ්ඩුව කාලෙත් බැලුව මේක කරන්න.පරිසර අධිකාරියෙන් කිව්වා මේකට කිසිසේත්ම අවසර දෙන්න බෑ කියලා.බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගෙ ප්‍රධානත්වයෙන් තියපු සම්බන්ධීකරණ කමිටු රැස්වීමෙදි ඕගස්පෙ ඉඩමට පරිසර අධිකාරියෙන් විරෝධය පල කලා.හැබැයි ඊට පස්සෙ අප කල යුත්තේ මධ්‍යම පරිසර අධිකාරියෙන් විරෝධය පල කලා.හැබැයි ඊට පස්සෙ අප කල යුත්තේ මධ්‍යම පරිසර අධිකාරියෙන් මේකට මොනම හේතුවකින් අවසර දෙන්නෙ නැත්නම් වෙන විකල්ප ඉඩමක් හොයන්න ඕන.ඊට පස්සෙ විකල්ප ඉඩමක් හොයලා සභා තීරණයක් මගින් අනුමත කරගෙන මේක හදන්න සියලුම මුදල් සභාවෙ නොමැති නිසා අපි දේශීය සංවර්ධන අරමුදල වෙත යොමු වුණා ණයක් ගන්න.ඒ වන විට අපිට ලක්ෂ 500ක් පමණ අනුමත කරන්න එකග වෙලා තියනවා.එහිදී ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගන්න කියල අපට ප්‍රකාශ කලා.එහිදී අපිට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියත් ගන්න පුළුවන් වුණා.මුදල් රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලැබෙනවා සෙහාන් සේරසිංහ මැතිතුමාත් කිව්වා අඩුම ගානේ කෝටියක්වත් දෙන්නම් කියලා.ඉදිකිරීම් කරගෙන යනකොට ලබන වර්ෂය තුළ ඒ මුදල දෙන්නම් කියලා ප්‍රකාශයක් කලා.ඉතිං ඉදිකිරීම් පටන්ගන්න කෝටි දෙකක් විතර ඕන වෙනවා.මේ මුදල හොයාගෙන ආදාහනාගාරය පටන් ගන්න හැදුවෙ හැම මළගෙදරකම කතා වෙනවා ඇයි මාලිම්බඩට ආදාහනාගාරයක් නැත්තෙ කියලා.මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර කළ යුතු කාර්යන් කීපයක් තියනවා.පතල් හා භූ විද්‍යා කාර්යංශයේ අවසර ගන්න ඕන.ඒකට රු.18000ක් විතර යනවා.ඊට අමතරව පස් ඇදීමටත් මුදලක් වැය වෙයි.ඒ සඳහා තමයි මේ අනුමැතිය ගන්න ඉදිරිපත් කලේ.අපිට ඒක නොමිලේ කරගන්න පුළුවන්.නමුත් රටේ පවතින නීතිමය තත්ත්වය අනුව ඒක කරන්න අමරුයි.විගණනයෙන් ප්‍රශ්න මතුවනවා.පත්තරේ දාලා හරි මේ පිළිබඳ තීරණයක් ගන්න වෙනවා.මේ සියලුම කරුණු සලකා බලලා මේකෙ වැඩ ආරම්භ කරන්න සභාවේ අනුමැතිය ගත යුතුයි.මම හැමදාම කියනවා මොන දේ අනුමත කරත් ඒක ක්‍රියාත්මක කරන්න සභාවෙ අනුමැතිය ගන්නවා කියලා.ඒ නිසා අනුමැතියට යොමු කරනවා.ඉතිං මේ සම්බන්ධ ඔබතුමාලාගේ අදහස් තියනවා නම් ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>

සභාපතිතුමා ඇතුළු සිටලු දෙනාගෙන්ම අවසරයි.දීර්ඝ කාලයක් තිස්සෙ මේ ආදාහනාගාරය කියන සිහිනය මන්ත්‍රීවරුන් වුන අපටත් බල ප්‍රදේශයේ ජනතාවටත් ඉතාම අත්‍යවශ්‍ය දෙයක්.මේ ආදාහනාගාරය ඉදිකිරීම කියන එක ගත්තොත්තින් අපි සභා කිහිපයකදීම යෝජනා දාලා ස්ථිර කරලා කටයුතු කරත් ගැටලු කීපයකටම මූණ දෙන්න සිද්ද වෙලා තියනවා.ඊගස්පෙ ඉඩම ගැන සභාපතිතුමා කතා කලා.අපි මේ සභාව තුළත් පළවෙනියටම මේ ගැන සාකච්ඡා කලා.කොහොමද ආදාහනාගාරයක් ඉදි කරන්නේ.කොහොමද මේ ආදාහනාගාරය අපිට ලබා ගන්නේ කියලා.බිම් කොටසක් ඉදි කරලා කටයුතු අද වෙනකන් කරගෙන ආවා.මේක හොද දෙයක් සමහර සභා වලට ආදාහනාගාර දෙක තුන තියනවා.මේක ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් බවට වර්තමානයේ පත් වෙලා තියනවා.ඒ පිලිබද කිසිම විසංවාදයක් නෑ. ඔබතුමාගේ යෝජනාවට විරුද්ධව යනවා නෙවෙයි.ප්‍රතික්ශේප කරනවා නෙවෙයි.ජනතාවගේ අවශ්‍යතාවය තේරුම් අරගෙන ඒ අයට සේවයක් කරන්න තමයි ඔබතුමා මේක ගෙනාවේ. හැබැයි ගරු සභාපතිතුමනි අද අපි මේ ඉන්න තත්වෙ අනුව මේ වගේ විශාල මුදලක් වියදම් කරලා මේ වගේ ව්‍යාපෘතියකට සභාව පෙළඹුනොත් මිනිසුන්ගෙන් විශාල විවේචනයක් එන්න පුළුවන්.වර්ථමානයේ රටේ පවතින තත්ත්වයත් අමුද්‍රව්‍ය හිගයත් නිසා මේ වගේ දැවැන්ත ව්‍යාපෘතියකට නොගිහින් ඉදිමු කියන යෝජනාව ගරු සභාවට යෝජනා කරන්න කැමතියි.ඇත්තටම මූල්‍ය ආදායම අතින් ගත්තොත් ඉතාම දුප්පත් සභාවක්.අපි කාලාන්තරයක් තිස්සෙ මූල්‍ය තැම්පතුවක් තියාගෙන ආවා ආදාහනාගාරය වෙනුවෙන්.මේ මුදල මදි මේ ආදාහනාගාරය හදන්න. එහෙම වුණොත් අපිට ණය මුදලකට යන්න වෙනවා. මං හිතන්නෑ මේ අවස්ථාවේ අපිට ණය මුදලක් අපිම අනුමත කරලා දෙයි කියලා. මගේ දැනුමේ හැටියට සම්පූර්ණ වැඩ ඉවර කරන්න කෝටි 12ක් පමණ වැය වෙනවා. කෝටි7ක් වගේ මුදලක් හොයාගෙන මේක අතර මග නතර කරන්න වුනොත් මේ තියන ආර්ථික ව්‍යාකූලතාවය හා අමුද්‍රව්‍ය වල හිඟතාවය තාක්ෂණයේ හිඟතාවය දිනෙන් දින වැඩි වෙනවා. මේ වගේ කටයුක්තක් ආරම්භ කරල අතරමග නවත්වන්න වුනොත් එහෙම අපට ඉතිහාසයේ අත්දැකීම් තියෙනවා. ඊගස්පෙ අපි ආයේජනය කරපු එක වෙනුවෙන් ඇතැම් අවස්ථාවල ගැටලු මතුවුනා. මං හිතනවා මේ කැනීම් කටයුතු මූලික කටයුතු වෙනුවෙන් අපි මුදලක් වැය කරලා මේ ආදාහනාගාරය ඉදිකරගන්න බැරිවුනොත් විනය පියවර ගන්න ඉඩ තියෙනවා. මුදලපක් ආයෝජනාය නොකර ඇස්තමේන්තු මුළු මුදල හොයාගෙන ඒ ප්‍රතිපාදන ලබා දෙන මේ කටයුක්ත කරන්න කියන එක මම දෙවනුව යෝජනා කරනවා. මොකද අතරමග නවතා දමනවා නම් මේක පටන්ගන්න එක තේරුමක් නෑ. ඒ මූල්‍යමය ප්‍රශ්න මෙතනදී මතුවනවා. සභාපතිතුමණි ඇත්තටම ආදාහනාගාරය අවශ්‍යයි සභාවට හැබැයි මේ අවස්ථාවේදී මගේ සුල්තානාගොඩ කොට්ඨාශය ගත්තොත් පයින් මරණෙ කරගහගෙන යන්න පුළුවන් දුර ආදාහනාගාරය තියනවා. ඒක නිසා මං හිතනවා දළ වශයෙන් ඇස්තමේන්තු කරලා බැලුවහොත් මාසෙකට මූලික වියදම ආවරණය කරගන්න. මරණ 60 පුච්චන්න වෙනවා. මං විශ්වාස කරනවා මේ කාල සීමාව තුළ අපටත් මැරෙන්න සිද්ද වෙනවා ආදායම හොයාගන්න. රටේ තියන මේ වාතාවරණය අනුව ගැටලු රාශියක් පැන නගිනවා. මේකත හොද යෝජනාවක් අනිවාර්යයෙන්ම විය යුතු දෙයක් නමුත් මේකට මුල්ගල තියන්න මේක සුදුසු වෙලාව නෙවෙයි කියන තැන මං ඉන්නවා. මේ යෝජනාව තාවකාලිකව ක්‍රියාත්මක නොකර අනාගතයේ මේක ක්‍රියාත්මක කරමු කියන යෝජනාව කරනවා. මේක අපි සභාවේ මුදල් වෙන් කරල තියෙනවා වෙන දේකට ගන්න බැරුව. ඒක නිසා මේක තාවකාලිකව නතර කරන්න ඒකමතිකව සම්මත නොවුන හොත් බෙදීමකින් තීරණයක් ගන්න කියන යෝජනාව කරමින් නිහඩ වෙනවා. ස්තුතියි.

<u>ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා</u>

ගරු සභාපතිතුමනි, ලසන්ත මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමට මං ගරු කරනවා වගේම පිලිගන්නවා. ආදාහනාගාරය ඉදිකිරීම අත්‍යාවශ්‍ය වුනත් වාර්තමාන ආර්ථික තත්වය නිසා මේ සඳහා සභාවේ අරමුදල් යෙදවීම යෝග්‍ය නැ නියන එතුමාගේ යෝජනාව මං අනුමත කරනවා. ඒකට හේතුව එකක් තමයි සභාවට අවශ්‍ය ප්‍රාග්ධනය නැහැ. මොකද කෝටි 2 ½ ක් වගේ ප්‍රමාණයක් තමයි තියෙන්නෙ. අර කිව්ව වගේ කෝටි 12ක් වැය වෙනවා. ණය මුදල අනුමත

කරගන්නෙ නැතුව මේක ආරම්භ කරන එක ගැටලුවක් අර කිව්ව වගේ බිම සකස් කරල ඉදිරි කටයුතු කරන්න බැරි වුනොත් මූලික මුදලට මොකද වෙන්නෙ. ඔබතුමා කිව්වා නොමිලේ කරගන්න පුළුවන් කියලා. සමහර දේවල් පිළිබඳ අපිට ලොකු විශ්වාසයක් නෑ. මොකද පහුගිය කාලෙ සිදුවීම් එක්ක. ඒ නිසා ණය මුදල අපි හොයා ගන්නකන් ඉදිකිරීම නතර කරන ලෙස ලසන්ත මන්ත්‍රීතුමාගේ අදහසට මං ගරු කරනවා. මොකද ණය ගත්ත කියලා ණය ගෙවන්නෙ කොහොමද? ඉදිරියේදී අපේ සභාවලට එන ආදායම බරපතල විදියට අඩු වෙනවා මොකද මුද්දර බදු/උසාවි දඩ මුදල් ආදාය ඔප්පු ලිවීම අඩුවෙන කොට එන ආදායම අඩුවෙනවා ඉදිරියේදී ණය ගෙවන්න බැරි වෙනවා. මොකද ණය ගෙවන්න ගියොත් සභාවේ එදිනෙදා කටයුතු අඩාල වෙනවා. අපි දන්නවා ස්ථිර නොවූ පිරිසක් ඉන්නවා. ඔවුන්ගේ වැටුප් වගේම නඩත්තු කටයුතු සඳහා විශාල වියදමක් යනවා. අපිට ආදායම් අඩු වුනාට පස්සෙ කොහොමද අපි ණය මුදලක් ගෙවන්නෙ. ඒ අවදානම් භාර ගන්න ඕන. මේ අනියම් සේවකයේ අයින් කරන්න බැනේ. මොකද ඔවුන් අයින් කරොත් සභාව පවත්වා ගෙන යන්න බැරැ වෙනවා. එවැනි අවධානම් තත්වය තියෙනවා. ඒ අවධානම අපිට දරන්න බෑ. අනිත් එක වාරිකේ කොහොම වෙයිද කියලා කියන්නත් බෑ. දැන් උස්ගොඩ තමයි ආදාහනාගාරය ඉදිකරන්න බලාපොරොත්තු වෙන්නෙ පාරෙන් කිලෝ මීටර් 2ක් සහ ගුවනින් කිලෝමීටර 1ක් වරකපිටිය ආදාහනාගාරය තියනවා. කනත්තගොඩ ආදාහනාගාරය තියනවා. යටියන තියෙනවා. මාතර ආදාහනාගාර 2ක් තියනවා. අකුරැස්ස, කද්දුව, කුඹුරුපිටිය එකක් තියනවා. ඔබතුමා මේ යෝජනාව ගෙනාවට පස්සේ තිහගොඩ ප්‍රාදේශීය සභාවෙන් මම සැප්තැම්බර් මස දුරකථන ඇමතුමක් දීලා බැලුවම අගෝස්තු මාසේ මරණ 5යි කරල තියෙන්නෙ ඒ ප්‍රාදේශීය සභාවලට ආදාහනාගාරය පවත්වාගෙන යාමේ ගැටලුවක් තියනවා. සේවකයෝ 3 දෙනෙක්ට වැටුප් ගෙවන්න ඕන. මහජන සේවාවක් තමයි. කිසි විවාදයක් නෑ. අපිට වඩා වත්කම් තියන සභාවක් තමයි තිහගොඩ සභාව. එහෙමත් ඒක නඩත්තුව අපහසුතාවක් වෙලා තියෙනවා. සේවකයෝ 3 දෙනෙක්ට වැටුප් ගෙවන්න ඕන. මහජන සේවාවක් තමයි. කිසි විවාදයක් නෑ. අපිට වඩා වත්කම් තියන සභාවක් තමයි තිහගොඩ සභාව. එහෙමත් ඒක බඩත්තුව අපහසුවක් වෙලා තියෙනවා. සභාපතිතුමනි 2021.05.24 පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ තියෙනවා මුදල් වියදමක් කිරීම සම්බන්ධව. ඒකේ අඩක් නිමකල වැඩ ඉවර කරන්න අපි සභාවේ මුදල් වෙන් කරන්න ඕන. ඒවත් කරලා මේකට මුදල් ඉතිරිවෙනවාද කියන එක ගැටළුවක්. අනිත් එක මගෙ ළඟ 2021.12.21 චක්‍රලේඛයේ තියනවා දැනට කරගෙන යන ව්‍යාපෘති වල වැඩ අවසන් නොකර නව ව්‍යාපෘති ආරම්භ නොකල යුතුයි කියලා. ඒක නිසා ලේකම්තුමිය මේ සම්බන්ධව අවධානය කළ යුතුයි. සභාවේ තියන ප්‍රාග්ධනය ප්‍රමාණවත්ද කියන එක සම්බන්ධව ඒ නිසා මේ කරුණු නිසා ලසන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ කල්දාන එක තමයි සුදුසු.

**<u>ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා</u>**

සභාපතිතුමා ඇතුළු සියලුම දෙනාගෙන් අවසරයි. පසුගිය කාලය තුල රජය මගින් ක්‍රියාත්මක කරපු ග්‍රාමීය මාර්ග වල කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීමේ වැඩසටහන අනෙකුත් ග්‍රාමීය මාර්ග කැටගල් ඇල්ලීමේ ව්‍යාපෘති වලට අවශ්‍ය තරම් මුදල් රජයේ තිබුනේ නෑ. හැබැයි අපි දන්න කාරණාවක් තමයි ඒ ව්‍යාපෘති වල කොන්ත්‍රාත් පිරිනමන කොට ඒ අදාල අදාල අය ඒවා අනුමත කරගන්න තමන්ගේ සන්තෝසම ගත්තා. අරගෙන ඒගොල්ලො ඇඟ බේරගත්තා සියලුම ව්‍යාපෘති අතරමග නතර වෙලා ඒ ව්‍යාපෘති කරපු වලට අද වෙනකොට මුදල් ලබාගැනීමේ දුෂ්කරතාවයකට පත්වෙලා තියෙනවා. ඒ වගේම අපිට ජේනවා ව්‍යාපෘතියත් ඇස්තමේන්තු අනුමත කරන්න ඉහල නිලධාරීන්ගේ අනුමැතිය අවශ්‍ය වෙනවා. ලොකු කර්මාන්තයක් මේක පිරිනමනකොට කොන්ත්‍රාත්කරුවෙකුට ඕනම කෙනෙක් දන්න කාරණාවක් තමයි මොකද්ද ඕනම සංවර්ධනයක් සිද්ද වෙන්නෙ ඒකෙන් කොමිෂන් එක තමයි ඒ අදාල බලධාරීන් ගත්තෙ. ඒක ගනීවි එයා හැබැයි වැඩේ නොකෙරුනොත් මුදල් නැතුව අපිටත් සිද්ද වෙනවා මේ පාපකර්මයට අතගහන්න. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ ප්‍රකාශය අපි විශ්වාස කලා අවස්ථා කිහිපයකදී. හැබැයි ඒ මුදල් ලැබෙනවා කියන

ප්‍රකාශය අද සමහර දේවල් වලදී බොරුවෙලා තියනවා. ඒ නිසා ඔබතුමා ණය මුදල අනුමතයි කිව්වට අපිට ලිඛිතව මෙන්න මේ මුදල මෙච්චරක් අනුමතයි කියලා සනාථ කරොත් ඒ මුදල ලැබෙනවා කියලා පේනව නම් අපිට අපි එදාට මේ වැඩේ ආරම්භ කරමු. එහෙම නැත්නම් පෙර යෝජනාවලට අනුව කල් තියල අදාල මුදල් සොයාගෙන ඉවර වෙලා මේ වැඩේට මුල පුරමු කියන ඉල්ලීම කරමින් යෝජනාව කල් තබන්න පෙර ඒ සඳහා විරෝදය පල කිරීම සිදු කරනවා. ස්තුතියි.

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා ඒ වගේම ලේකම්තුමිය අද විශේෂ සභාවක් කැදවලා එය නීත්‍යානුකූල නැති වුනත් සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි සාමාන්‍ය ලෙස කැදවීම සිදු කලා. ඒ අවස්ථාවේදී ඇත්තටම යෝජනාවල් බැලුවම අපිට පේනවා මේ යෝජනාවල් සියල්ලම වගේ ඉතා කඩිනමින් කීපදෙනෙක්ගේ අවශ්‍යතාවයට ගෙනාපු යෝජනාවල් හැටියට මේවා දැන් අපි සියල්ල වෙන වෙනම ගත්තට කතා කරන්න පුළුවන් නීත්‍යානුකූල භාවයේ අඩුවක් තියනවා කියන එක පේනවා.මොකද අපි සභාවට එන්නේ සභා වාර්තාවේ තියන යෝජනාව නීත්‍යානුකූල ලෙස සභාවට ඉදිරිපත් කිරීමට නීත්‍යානුකූල ලෙස න්‍යායපත්‍රයට ඇතුලත් කිරීම නිසා මේ දීපු යෝජනාවල් ලේකම්තුමියට ලිඛිතව දීපු බවට ඉදිරිපත් කරන්න කිව්වොත් මං දන්නෑ එතුමියට ලිඛිතව දීපු බවට ඉදිරිපත් කරන්න කිව්වොත් මං දන්නෑ එතුමියට ඒක කරන්න පුළුවන්ද කියලා. ඒක නිසා සභාපතිතුමන් ආදාහනාගාරය ගැන 2002 අපි සභාවට එනකොටත් මේක ගැන කතා කරලා තිබුණා. එතකොටත් ඔබතුමා සභාවේ හිටියා ඥාණසිරි මැතිතුමා සභාපති පුටුවේ හිටියා. ඕගස්පෙ ආදාහනාගාරය පටන් ගන්න ලක්ෂ 1 ½ ක් සභාවේ මුදල් යොදවල තියනවා කියලා අධිහාර වෙනතැනටත් වෙන තැනටත් පත්වුනා ලොකු විමර්ශන තිබුණා. ඒ කොන්ත්‍රාත් කරුවොත් ලොකු අපහසුතාවයකට පත්වුනා. බල ප්‍රදේශය තුල ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුනා. ඒ කාලෙ අපි වගෙ දුප්පත් සභාවකට ආදාහනාගාරයයක් අවශ්‍යයි කියපු තැන. සියළු දෙනා හිටියත් රටේ පවතින ආර්ථික තත්වය අනුව නැත්නම් ජන ජීවිතය ගත කරන මිනිසුන්ගේ ආදායම අනුව අපි සභාවට ලැබෙන ආදායම දෙස බැලුවම කොටි 10ක මුදලක් ණයට අරගෙන ගෙවන්න බෑ කියන එක අපිට පේනවා. ඒ කියන්න අපි පසුගිය කාලේ තුල වරායට ණය අරගෙන ඒක විකුණන්න සිදු වුනා. ක්‍රීඩාංගනයක් හැදුවා හම්බන්තොට අන්තිමට දාරාගන්න බැරිවුනා වියදම්. රජය වගේම ජනතාවත් අපහසුතාවයට පත්වුනා. අර්බුධයත් ඇති වෙච්ච මේ අවස්ථාවේ අපි මේ කෝටි 10ක් ණයට අරගෙන කෝටි 16ක් වත් යනවා මේක හදන්න. දැන් තියන වියදමක් එක්ක කලින් කෝටි 5යි නම් දැන් 15ක් යනවා. මේ අවුරුද්දක් ඇතුලත ඇතිවෙච්ච භාණ්ඩ වල මුදල් වැඩිවීමක් එක්ක කිසිසේත්ම සාමාන්‍ය කෙනෙකුට ගෙයක් දොරක් හදාගන්න බැරි යුගයක් ඇති වෙලා තියෙන්නෙ. එකට 5කින් විතර මිල වැඩිවීමක් වෙලා තියෙනවා. කෝටි 15ක් විස්සක් අතරවත් යනවා මේක හදන්න. අපේ සභාවේ සභාපති සහ ලේකම්තුමියගෙන් අහන්න ඕන මාසෙකට තියෙන ආදායම කීයද කියලා. කෝටි 10ට 8%ට ගත්තත් අඩුම ගානේ ලක්ෂ 50ක්වත් ගෙවන්න වෙනවා මාසෙකට. ඉතින් අපි ලක්ෂ 50ක් ගෙවන්නෙ කොහොමද මේ වගේ ණයක් අරගෙන මේ ඉදිකිරීම කරලා ඒ ලක්ෂ 50 ගෙවනකොට එතන වියදම් වලටත් අඩුම ගානේ සේවකයො දෙන්නයි මුරකරුවෙකුගෙයි වැටුප් ගෙවන්නත් වෙනවා ඒවත් එකක් ලක්ෂ 50 ක් ගෙවන්නෙ කොහොමද අපිට වඩා ලොකු වැලිගම සභාවටත් කෝටි ගානක ආදායම් තිබුණත් ගෙවා ගන්න බැරි වෙලා තියනවා අපි වගේ සභාවක් ආදාහනාගාරයක් හදන්න ඕන රජයෙන් නොගෙවන මුදලක් හම්බ වුනොත් මංගල සමරවීර මැතිතුමා ඉද්දි කිව්වා නොගෙවන මුදලක් දෙන්නම් වැඩ කරමු කියල ඒ වෙලාවෙ අවාසනාවකට ඒක කරගන්න බැරිවුනා. නොගෙවන මුදලක් කෝටි 10 ක් 15 ක් හම්බවුනොත් අපට කරගෙන යන්න පුළුවන් නැත්නම් කිසිසේත්ම අපිට ගෙවන්න බැරිවෙලා අපේ බල ප්‍රදේශය තුළ ජන ජීවිතය අපහසුතාවයකට පත් වෙයි. මොකද කුණුටික එකතු කරගන්න බැරිවෙයි. වීථි පහන් හදන්න බැරිවෙයි පාර දෙපැත්ත සුද්ද කර ගන්න බැරි වෙයි. කොන්ත්‍රාත් පදනම මත ගනිපු සේවකයන්ටත් වැටුප් ගෙවා ගන්න බැරිවෙයි අපිට පේනවා

දැන දැනත් ඒ අර්බුදය අද රට වැටිච්ච තැන. මේ වෙලාවෙ ජනාධිපතිතුමා අගමැතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය කියනවා අලුත් යෝජනා සභා වලින් පටන් ගන්න එපා කියල ඉදිරි කාල වලදි රැකියා කරන අයගේ වැටුපෙන් කොටසකුත් සභා වලට ගෙවන්න වෙයි කියලා ඉතින් චක්‍රලේකයේ එකක් කියනවා අපි එකක් කියනවා. මම දැක්කා පසුගිය දවස් වලත් මේ වගේ යෝජනා සභාවට ගෙනාවා රජයෙන් කියනවා කොටසක් පන්සලෙන් දාන්න ඕන කියල විදුලි බිලට සභාවෙන් කියනවා සම්පූර්ණ බිල සභාවෙන් ගෙවන්න කියලා එතකොට රජයට විරුද්දව යන සභාවක් ලෙස මං දකිනවා එපමණ ක් නෙවෙයි මහජනතාව ලොකු අපහසුතාවයකට පත් වෙනවා මේ වගේ ලොකු මුදලක් අරන් ගෙවා ගන්න බැරි වුනාම ඒක නිසා ජනතාවට පාරක තොටක බැහැල මේ විදියට යන්න හරි කරගෙන යනවද එහෙම නැත්නම් ඒ මිනිස්සු පාරට බස්සලා උද්ඝෝෂණය කරන තත්වයට පත් කරන වද ලොකු ව්‍යාපෘතිවලට ගිහිල්ලා අධිභාර ගෙවන්න මන්ත්‍රීවරුන්ට සිද්දවෙයි. හාගෙට ගොඩනැගිල්ලක් හදලතියලා එතන අපිට මුදල් ගෙවා ගන්න බැරි වෙනකොට මන්ත්‍රීවරුන්ටත් වෙන්නෙ තමන්ගෙ දේපල බැංකුවට උගස්තියල ඒ ණය ගෙවන්න කරන්න අපහසු දෙයක් කරන්න බැ ඇත්තටම අවශ්‍ය තමයි ඒ වුනාට අපිට දරාගන්න බැරිනම් ඒ ණයමුදල අපි ඒක ක්‍රියාත්මක කලොත් තවත් අපහසුතාවයට පත් වෙනවා රට හොඳතැනට නොගෙවන ආදාරයක් ඇවිල්ලා මේක ක්‍රියාත්මක කරන තැනට ආවොත් කරමු පස් කපන්න හෝ වෙනත් දේකට සභාවේ මුදල් සතයක්වත් වියදම් කරන්න එපා මොකද අපි දන්නවා මේක ක්‍රියාත්මක කරන්න බැරි යෝජනා මේක දැන දැන බේදීමක් තියලා චන්දයක් තියල පස්සට දැම්මට කමක් නැ බෙදීමක් ලබා දෙන ලෙස ඉල්ලමින් නිහඩවෙනවා ස්තුතියි.

<u>ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා</u>

ගරු සභාපතිතුමණි, ගරුමන්ත්‍රීතුමණි සමස්ත කාර්යමණ්ඩලයෙන් අවසරයි. මුලින්ම කියන්න ඕන මේ ආදාහනාගාරය හැදුවත් සතුටු වෙනවා නොහැදුවත් සතුටු වෙනවා මං මොකද මගේ කොට්ඨාසයේ තමයි මේක හදන්නෙ ඒ නිසා හුගදෙනෙක් මාත් එක්ක මේ වෙලාවෙ හදනවටත් තරහෙන් ඉන්නවා හදන්නැතුවටත් තරහෙන් ඉන්නවා දීර්ඝකාලයක් තිස්සේ මාලිම්බඩ සභාව නියෝජනය කරනකොට හැමෝම කතාබහට ලක් වුණේ ආදාහනාගාරය ගැන මේකට වෙන වෙන ව්‍යාපෘති පටලවලා උදාහරණ දෙන්න උත්සාහ කරනවා. ඒකට උදාහරණ දෙන්න උත්සාහ කරන වෙලාවේ මේ වගේ දේකට ගියේ ඇයි අපේ පොරොන්දුවල තිබුණු දෙයක් තමයි ආදාහනාගාරය හදන එක මාත් ලීප්ලට් එකේ සඳහන් කලා අනිත්අයත් සඳහන් කලා අපිට බලයක් ආවොත් මේක කරනවා කියලා අනිත් සභාවල් අපිට පස්සෙ ක්‍රියාත්මක වුනේ අපිට තිබුනේ භූමියේ ගැටලුව ඕගස්පෙ ආදාහනාගාරය හදන්න එදා මෙදා කාලය තුළ කතා  කරල නැතිවෙනකොට මම අකමැත්තෙන් වුනත් මගේ කොට්ඨාසයෙව් දොස්තර වික්‍රමසිංහ මැතිතුමා ගල්ඇන්දකුට්ටිය  ගම්මානය බෙදල දෙනකොට වෙන්කරල තිබ්ච්ච ගල්ඇන්දකුට්ටිය ගමේ සුසාන භූමියට වෙන් කරල තිබූ කොටස ආදාහනාගාරයට දෙන්න මම කැමතිවුනා විතරක් නෙමෙයි ඒ සඳහා තාඩන පීඩන සියල්ලක් ආවා ඒ කිසිවක් මාලිම්බඩ සභාවේ සමස්ත ජනතාව වෙනුවෙන් ඉවසාගෙන මම මේ යෝජනාව එකපයින්ම කැමැත්තෙන් හිටියා. ඒ විතරක් නෙමෙයි මරණයක් වුනාම ඒ තැන්වලට යන නිසා ආදාහනාගාරයක් වෙන් කර ගන්න තියන දුක දන්න නිසා මාලිම්බඩ ජනතාව පීඩාවට පත්වන නිසාත් අලස්වත්ත, කිරිමැටිමුල්ල තෙලිජ්ජවිල  ග්‍රාමසේවා වසමක්ම අද පර්චස් 10 ක්ම සීමා වෙලා එදා අක්කරයක් තිබ්ච්ච භූමියේ පර්චස් විස්සක පවුල් දෙක තුන ගෙවල් හදලා මරණයක් වලදාගන්න තැනක් නැතිවෙලා අසරණ වෙලා ඉන්න වෙලාවක අපිටම කියල ආදාහනාගාරයක් තියනවා කියන එක කොතරම් වැදගත්ද  කියන කාරනාව හෙට දවසේ  අපේ මන්ත්‍රීදූරයෙන් සමුගනී අපේ කාලයේ මේ වගේ දෙයක් මාලිම්බඩට දායාද කළා කියලා අපිට

සතුටු වෙන්න පුළුවන්.අද ප්‍රශ්නයක් කොට සලකන්නේ දේශීය ණය අරමුදල ලබා දෙන ණය පිළිබඳවයි.මං හිතනවා වෙන වෙන සහතික ඉල්ලන මේ වෙලාවේ තම තමන් ගම්මාන වලට කරපු දේවල් වල සහතික හෙට දවසේ සභාවට ඉදිරිපත් කරන්න අපි සූදානමින් ඉන්නවා.මොකද සභාව නොමග යවමින් කටයුතු කරන ආකාරය පේන්න තියනවා.ඒනිසා දං මේ වෙලාවේ ආදාහනාගාරය හැදුවත් සතුටුයි.නොහැදුවත් සතුටුයි.හැබැයි හදන මට්ටමේ හදන තැන ඉදගෙන කතා කරනවා වගේම ඒ වෙනුවෙන් ඕනෑම සහයෝගයක් ලබා දෙනවා.මාලිම්බඩ මිනිස්සු අපෙන් අහන කාරණය තමයි ආදාහනාගාරය හදන්නෙ නැද්ද කියන එක.ලසන්ත මන්ත්‍රීතුමා පෙන්වා දෙන ආකාරයට දේශිය ණය අරමුදලෙන් ණය ගන්නෙ කොහොමද කියන කාරණාව.සමන් දෙණිපිටිය මන්ත්‍රීතුමා කියන ආකාරයට ණය ගෙවන්නෙ කොහොමද කියන කාරණාව මං හිතන්නෙ අපිට මල් ශාලාවක් අල්ල ගත්තොත් මේක කරන්න බැරි කමක් නෑ.වරකපිටිය ආදාහනාගාරය වර්ෂයකට මරණ 700යි.ඒකෙන් 300කට වැඩිය දීලා තියෙන්නේ මම.මම හිතනව මේ තුළින් වක්‍රව තව කීපදෙනෙකුට රැකියා ලැබෙනවා.මිනිස්සුන්ට සහනයක් ලැබෙයි.ඒ ප්‍රදේශ වල මාර්ග පද්ධතිය හැදෙයි.ඒ නිසා දං නැවත නැවත මතක් කරනවා දං මේ යෝජනාවට උපරිම සහයෝගය දක්වනවා කියලා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමා ඇතුළුව මන්ත්‍රීතුමාලා වැදගත් අදහස් ප්‍රකාශ කිරීමක් කළා.මෙහි වැදගත් දේවලුත් තියනවා.සිතිය යුතු නැති දේවලුත් තියනවා.මං මතක් කරනවා මේ ව්‍යාපෘතිය අනුමත කිරීමේදී සකස් කිරීමේදී මහ ඇමතිතුමාගේ අනුමැතියට යොමු කරන කොට ඇස්තමේන්තු මුදල තුන්කෝටි 70 දාහයි.අවුරුදු 3කට පෙර.දැන් හත් කෝටි 75 ලක්ෂයක මුදලක් ඇවිල්ලා තියනවා.ලක්ෂ 25ක් විතර භූමිය සකස් කරන්න යයි.ඉතිං මේ මුදල තව අවුරුදු ගානක් යනකොට මීට වඩා වැඩි මුදලක් වෙයි.ඉතිං අපිට හිතා ගන්නත් බැරිවෙයි මේක

අපිට හදන්න පුළුවන් වෙයිද බැරිද කියලා.මේකේ බාහිර ප්‍රශ්න කීපයක් තියනවා.මාලිම්බඩ ආදාහනාගාරයෙන් බලාපොරොත්තු වෙන්නේ කොට්ඨාශයේ මිහිදන් කිරීම්,ආදාහනයට යොමු කිරීම් වගේම වක්‍ර ගැටලු කීපයක් තියනවා.අපේ අයට මරණයක් වුණාම මාතර නගර සභාවට හෝ වැලිගම,කඹුරුපිටිය,අකුරැස්ස සභා වලට යන්න වෙනවා.ළග තියනවා නම් දුර යන්න ඕන නෑ.තෙලිජ්ජවිල සභාව මගින් මුදල් එකතු කිරීම බලාපොරොත්තු වෙනවා.තවත් ගැටලුවක් තියනවා.වෙන් කර ගන්නකොට වෙන් කරලා ආවට පස්සේ කියනවා ඒ වෙලාව දෙන්න බෑ කොට්ඨාශෙ කෙනෙක් බුක් කරලා කියලා.ඉතිං මේක අපිට මදි කමක්.ඒ වගේම මුදල් ප්‍රමාණය වැඩියෙන් අය කරනවා.කොට්ඨාශෙන් පිට අය කරන මුදල වැඩියි.එක පැත්තකින් ඕගස්පෙට වඩා නාපේ ඉදිකිරීම තුළ මරණ ප්‍රමාණය වැඩියි.අවට පැති වලින් මරණ මෙහෙට ළගා වෙනවා.ඒ නිසා මරණ අඩුයි කියන්න බෑ.ඊළග ගැටලුව කොහොමද ණය ගෙවන්නේ කියන එක.අපි ගණන් බැලුවා ලක්ෂ 40ක් විතර අවුරුද්දකට යනවා.ණය ගෙවන්න මේකෙන් ලක්ෂ 29ක් 30ක් මරණ වලින් එනවා.අලු තැම්පත් කිරීමෙන් මුදලක් ගන්න බලාපොරොත්තු වෙනවා.මේවා තමයි අපි ණය මුදල ගෙවන්න අවධානය යොමු කරලා තියෙන්නේ.මේ කාරණා සියලු දෙනාම හිතන්න ඕන.හැම ආණ්ඩුවක්ම මැතිවරණය ජාතිවාදය ඉදිරියට දාගෙන ආවේ.ඒ වගේ තමයි ආදාහනාගාරය ඉදි කිරීම හැම පක්ෂයකම ඉදිරියටත් මැතිවරණ පොරොන්දුවක් වෙනවා.මට ඕන වුණේ මේක නිට්ටාවටම සුව කරන්න.තව දුරටත්

පොරොන්දුවක් නොවී මේ කාර්ය භාරය අවසන් කරන්න.තමුන්නාන්සේලාගේ මතය තමයි මේ ඉදිරිපත් වුණේ.ඒකට මං ගරු කරනවා.අපි මේක කරනවද නැද්ද කියලා ස්ථිර තීරණයකට යන්න ඕන.කල් දාන එකේ තේරුමක් නෑ.මේක මැතිවරණය ගැන චලනය වන වෙලාවක් එහෙම මොහොතක කල්දාන එකේ තේරුමක් නෑ.මම පැහැදිලිවම දන්නවා අපිට ණය මුදල ලැබෙනවා.දේශිය ණය අරමුදලෙන් ඉල්ලුවෙ ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය. ආණ්ඩුකාරතුමා චක්‍රලේඛය ගැහුවේ අලුතින් වැඩ ආරම්භ කරන්න එපා කියලා.ඒක එතුමට කඩන්න බෑ.නමුත් මේක අත්‍යාවශ්‍යයි මං මේක අත්සන් කරනවා කියලා අත්සන් කළා.එහෙම කළේ මේකේ අවශ්‍යතාවය හේතුවෙන්.ඒ නිසා මම මේ වෙලාවෙ ඒ සියල්ල මතක් කරමින් යෝජනාව මං ගෙනාවට ක්‍රියාත්මක කිරීම ඔබතුමාලට භාරයි.ඒකමතිකව ලබා දෙනවා නම් එහෙමත් බෙදීමක් අවශ්‍ය නම් එහෙමත් ඔබගේ තීරණය ලබා දෙන්න.ලේකම්තුමියට ඉදිරි වැඩ කටයුතු භාර දෙනවා.

ඒ අනුව ආදාහනාගාරය ඉදිකිරීමේ යෝජනාව වැඩි ඡන්දයෙන් පරාජයට පත් විය.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

ඊළග යෝජනාව මාර්ග සංවර්ධනය පිළිබදවයි.මන්ත්‍රීවරුන්ගේ නම් වලින් තියෙන්නේ.

විමලවංශ මන්ත්‍රීතුමා

සභාපතිතුමනි,මේ යොජනා මන්ත්‍රීවරුන් නමින් ලැබිල තියනවද?ලේකම්තුමිය ඒවා සභාගත කරන්න පුළුවන්ද?

පෙ.ව 11.55ට සභාව විනාඩි 10කට කල් තබන ලදී.

නැවත ප.ව 12.05ට සභාව රැස්වන ලදී.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

ඉදිරි යෝජනා සියල්ල ඊළග සතියේ විශේෂ සභාවකට කල් තබනවා.අද විශේෂ සභාවක් රැස් කලේ ආදාහනාගාරය කරනවාද නැද්ද කියලා තීරණය ගන්න.සභාපතිතුමා විදියට බලයක් තියනවා මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කරන්න.

කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා විය.

යෝජනා කළේ ලසන්ත රණසිංහ මන්ත්‍රීතුමා

ස්ථිර කළේ සමන් දෙනිපිටියගේ මන්ත්‍රීතුමා

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ ලසන්ත රණසිංහ මන්ත්‍රීතුමා

ස්ථිර කළේ උප සභාපතිතුමා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

පාරම්පරික ක්‍රමයකට තමයි එදා ඉදලා සභා රැස්වීම් පැවැත්වුණේ.කවදාවත් අපි ලිපියක් භාරදීලා අත්සන් අරන් නෑ.ආදාහනාගාරය සම්බන්ධව තීරණයක් ගන්න තමයි අද ආවේ.ඒක තමයි ප්‍රධාන ඉලක්කය.ඒක කාගෙත් අදහස් මත ඒ විදියට විසඳුනා.ගැටලුවක් නෑ.මේ යෝජනා ටික නැවත සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා**

සභාපතිතුමා ඇතුළු සිලු දෙනාගෙන් අවසරයි.සභාව සතු ප්‍රජා ශාලාවල ගැටලුව පිළිබඳ මීට මාස කීපයකට පෙර මම කතා කරලා අවසානෙදි තීන්දුව ආවා පෙර පාසල් පාලිකාවට ලිඛිතව දැනුම් දෙන්න.ඒවගේ ලියුමක් තාම යවා ගන්න බැරි වීම පිළිබඳ කණගාටුයි.දර්ශන පෙර පාසලටත් සම්බන්ධ වුණා ඒකෙ නම මේකේ නෑ.පෙර පාසල් හරියට දැනුවත් වුණානම් ලිඛිතව තියෙන්න ඕන.පෙර පාසලෙන් ආරාධනාවක් ආවා නම් ඔබතුමා ගියානම් ලේඛනයක් නඩත්තු වෙන්න ඕන.ඔබතුමා හිතලා තමයි මේ යෝජනාව දැම්මේ.ඔබතුමාට යන්න බැරි වෙනවා නම් කොට්ඨාශෙ මන්ත්‍රීවරයට කියන්න යන්න කියලා.එතුමට ඒ ගෞරවය ලබා දෙන්න.මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා නම් නිසි ක්‍රමවේදයක් හදලා තෑගි දෙන්න.එහෙම නැත්තම් මං මේකට විරෝධය පළ කරනවා.මොකද හොරගොඩ පෙර පැසල් 03ක් තියනවා එයින් එකක්වක් නෑ.ඒ නිසා මගේ විරෝධය පළ කරනවා.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

මන්ත්‍රීතුමා මේ ක්ෂණිකවනෙ නම් ටික ඉල්ලුවේ.හොරගොඩට අපි ගියා.ගියපු ඒවට අපි දෙනවා.මගේ ඥාතිවරයෙක් කරන පෙර පැසලකුත් තියනවා ඒකත් හැලෙනවා.ප්‍රාදේශීය සභාවට සම්බන්ධ ඒවට දෙන්න ඕන.ගියපු ඔක්කෝටම දෙනවා.නැත්තම් ඒක ලොකු චෝදනාවක්.මේකට විරුද්ධත්වයක් තියනවා නම් බෙදුමකින් මේක තීරණයක් ගන්න.මේක සම්මත වුණාම පළාත් පාලන කොමසාරිස්ගෙන් අවසර ගන්නවා.

**6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු -**

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව